විද්‍යාලය : ර/ ඇඹිලිපිටිය ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දූර
**නිර්දේශිත ග්‍රන්ථය : සද්ධර්මාලංකාරය**

**ප්‍රශ්නය :** සද්ධර්මාලංකාර කතුවරයාගේ රචනා රීතියේ ඇති සුවිශේෂ ලක්ෂණ නියමිත කතා වස්තු ඇසුරෙන් විමසන්න.

# පිළිතුර සඳහා මග පෙන්වීම :

(1) සද්ධර්මාලංකාර කතුවරයාගේ රචනා රීතියේ ඇති සුවිශේෂ ලක්ෂණ නියමිත කතා වස්තු ඇසුරෙන් විමසන්න.

දඹදෙණි සාහිත්‍ය යුගයේ දී රචිත පාලි රසවාහිනිය ගුරුකොට ගනිමින් තම කතා කලාවේ ස්වාධීනත්වය ද මැනවින් විදහා දක්වමින් ගම්පොළ යුගයේ දී රචිත මාහැඟි ධර්ම ග්‍රන්ථය සද්ධර්මාලංකාරය යි. මෙය දෙවන ධර්මකීර්ති නම් හිමිනම විසින් රචිත බව සඳහන් වේ. ශ්‍රව්‍ය ගෝචර මාධ්‍ය හා මිශ්‍ර සිංහල භාෂා ශෛලිය මෙන් ම ආඛ්‍යාන රීතිය මෙම කෘතිය සඳහා ඉවහල් කරගෙන ඇත.

මෙම කෘතිය රචනා කිරීමේ අරමුණ ධර්මකීර්ති හිමියන් දක්වා ඇත්තේ,

''මාගධික භාෂාවෙහි නොහසළ සිංහල දීපවාසීන්ට නොදනෙන හෙයින් හෙළු බසින් පෙරළා ලංකාදීපවාසී වූ සාධු ජනයාගේ සිත් පහදමින් ලෝවැඩ වඩා බොහෝ කාලයක් පවත්නා පරිද්දෙන් ධර්ම ව්‍යාඛ්‍යානයක් කළ මැනවයි මෙසේ..... සද්ධර්මාලංකාරය නම් වූ ව්‍යාඛ්‍යානයක් දක්වමි.''

කතුවරයාගේ මෙම පූර්වෝක්ත කියමන අනුව මෙම කෘතියේ මූල කෘතිය ලියන ලද්දේ පාලි භාෂාවෙනි. නමුත් පාලි බස නො හදාළ සාධු ජනයන්ට කියවීමට සලස්වා, ඔවුන් තුළ ශ්‍රද්ධා බුද්ධි වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් රචිත බව මැනවින් පසක් වේ.

සද්ධර්මාලංකාරය ඉතා ජනප්‍රිය වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ දඹදිව කතා ම අසා, කියවා පුරුදු ශ්‍රාවක, පාඨක ජනතාවට දේශීය පුද්ගල හා සිද්ධි පසුබිම් කර ගනිමින් ගෙතූ කතා වස්තු වැඩි ප්‍රමාණයක් මේ තුළ ගැබ්වීමයි. එබැවින් මෙම කෘතිය පාඨක ආකර්ශනය ලබන්නට හේතු විය.

දන් දීම, බණ ඇසීම, සිල් රැකීම, නිරන්තරයෙන් බුදු ගුණ අනුස්මරණය, කෘතඥතා පූර්වක වීම බඳු චාරිත්‍ර අනුගමනයෙන් මෙලොව දීම පුද්ගලයා සැප-සම්පත් ලාභියෙකු වීමේ වාසනාව ලබන බව මෙහි එන කතාවලින් පෙන්වා දේ. විවිධ සමාජ තරාතිරම්වලට අයත් පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම් ද ඒ කතාවල ගැබ්වේ. එකී චරිතයන්ගේ හොඳ මෙන් ම නොහොඳ පක්ෂය සම්බන්ධයෙන් ද කතුවරයා පෙන්වා දෙයි.

පාලි රසවාහිණිය ගුරු කොට ගත්ත ද ධර්මකීර්ති හිමියන් තුළ වූ ස්වාධීන කතා කලාවේ ගති ලක්ෂණ මේ කෘතිය තුළ කොතෙකුත් දකගත හැක.

ඒ අතර ශ්‍රැතිගෝචර ශෛලිය ගුරු කොට ගනිමින් උපමා, රූපක ආදී ගැමි ජනහඳ ඇදබැඳ තබා ගැනීමට සමත් අලංකාරවත් බස් වහරක් ද ඒ තුළ දිගු වැකි, කෙටි වැකි, නාට්‍යෝචිත දෙබස් ද අවස්ථා හා සිද්ධි වර්ණනයට උචිත අලංකාරවත් භාෂාවක් තුළින් සාධු ජනයාගේ සිත් පහදවා දානය වැනි සාධු චරියාවන්ට ගරු සමාජයක් බිහි කිරීම ධර්මකීර්ති හිමියන්ගේ අරමුණට මග කියන ධර්ම ග්‍රන්ථය මෙයයි.

- ශ්‍රැතිගෝචර ශෛලියෙන් දේශීය කතා ඉදිරිපත් කර ඇති අයුරින් මෙය මාහැඟි ධර්ම ග්‍රන්ථයක් විය.
- දිගු වැකි කතා රසය තීව්‍ර කරයි.
  - ★ ''ලංකාද්වීපයෙහි අනුරාධපුර නුවර ශ්‍රද්ධාවන්ත වූ එක්තරා ස්ත්‍රියක් නිරන්තරයෙන් මල් කඩා ගෙනවුත් අභයගිරි වෙහෙරට හා දාගැබට පූජා කරන්නී ය.''
- ශ්‍රැති ගෝචර ශෛලිය මෙන් ම දිගු ඡේදයක අතර මැද කෙටි වැකි භාවිතය නිසා ශ්‍රාවක පිරිසට අසන්නට ප්‍රිය කතාවක් නිර්මාණය වේ.
  - ★ ''මෙම ලංකාද්වීපයෙහි මාවටු නම් පටුනුගම නන්දිය නම් වෙළෙඳාණ කෙනෙක් වෙසෙති. ඒ වෙළෙඳාණෝ ශ්‍රධාසම්පන්නයහ. තුනුරුවන් ම මට පිහිටය යි මමත්වය ඇතියහ;....''
- පාලියෙන් පැවති කතා වස්තු කතුවරයාට අභිමත සේ විවරණය කළ ආකාරය කදිම ය. ප්‍රශස්ත ය. අපූර්ව ය. ව්‍යවහාරික ගැමි බසට අනුකූල ව තත්කාලීන සමාජ සංදර්භය තුළ භාවිත වූ සිරිත්-විරිත්, ඇවතුම්-පැවතුම්, ආගමික විශ්වාසයන් හා නොයෙකුත් චරිතාදර්ශයන් අනුසාරයෙන් උචිත උපමා-රූපක-ප්‍රස්තාව පිරුළු මගින් අවස්ථාවෝචිත වර්ණනා මගින් තීව්‍ර කිරීම දක්නට ලැබේ.

- ස්වර්ණතිලකා වස්තුවෙහි උපමා
    - ලියකිඳුරන්ගේ නාද මෙන්
    - නානා වර්ණ මොනරුන් මෙන්
    - අභිනව බාලාර්ක මණ්ඩලයක් සේ
    - කොඳ කැකුළු මෙන්
    - විදුලි කලඹක් වැනි
    - ඔප් නැගූ රන් ටැඹක් මෙන්
    - තරුණ හිරු කලඹක් මෙන්
    - දැල බැඳුණු මසුන් මෙන්

- ස්වර්ණතිලකා වස්තුවෙහි රූපක
    - ★ සිත් නැමති ශරීරය
    - ★ මුඛ නැමති රත්පියුමෙහි
    - ★ නේත්‍ර නැමති භෘංගයෝ
    - ★ මුඛ නැමති පද්මයෙහි
    - ★ ලජ්ජා නැමති මහ ගැඹුරු අගල
    - ★ ධෛර්යය නැමති මහ පවුර
    - ★ නිල් නුවන් නැමති තද වූ ශර ප්‍රහාරයෙන්
    - ★ ස්ත්‍රීරත්නයක්

- නන්දිවාණිජ වස්තුවෙහි උපමා
    - ★ තද හීයකින් විත් කෑ මුවකු සේ
    - ★ කොඳ කැකුළු පෙළක් වැනි
    - ★ පණුවන් මතුවන කුණපනක් වැන්න
    - ★ පණුවකු මෙන්
    - ★ කසළ ගොඩක් වැන්න
    - ★ ගින්නට ළං විය නොහෙන මැස්සන් මෙන්

- රූපක
    - ★ මදලස බැලුම් නැමති ශර ප්‍රහාරය
    - ★ මවුකුස නැමති කුණපයෙහි
    - ★ මුඛ නැමති එක දොරින්
    - ★ ශරණ ශීල නැමති පාෂාණ ප්‍රාකාරයෙහි
    - ★ කඳුළු ධාරා නැමති රුධිරය
    - ★ මාතුගාම නැමති කුණපයෙහි
    - ★ නුවණ නැමති ඇස්
    - ★ කුසල් නැමති බිජු

- පාලි, සංස්කෘත වදන්
    - ★ ශරණ ගත
    - ★ ක්ලේෂමාර
    - ★ වණ්ණු තෛලයෙන්

- අවස්ථා හා සිද්ධි නිරූපණයට කෙටි සංවාදාත්මක බස් වහර මගින් ජීවය ලැබේ.
    - ★ ''එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට, මලස්න නො සෝධා කුමක් පිණිස මල් පිදී ද? තී කළේ කටයුත්තක් නොවේ''
    - ★ ''චණ්ඩාල කෙලී නම් තෙපිම යැ.''

- ශිව අමාත්‍යවරයාගේ වදන්

    - "එම්බා නැයෙනි, යහළුවෙනි, මිත්‍රයෙනි, තෙල උඩුමාලේ දෙවඟනක සේ සිටින්නෝ කවුරු ද, කාගේ දියණි කෙනෙක් දෑ"

- අනුප්‍රාසවත් පද සංයෝජනා

    - "මද මද සිනා සිසී...."
    - "රණකින්, මුක්තකින්, මැණිකකින් හිමියෝ නොවෙයි."
    - "එකදොරින් වැද හෙව නවවන මහ දොරින් නික්මෙති."

- ගැමි කට බස

    - "තොපට කුමක් කෙරෙම් දෑ...."
    - "කුමක් පිණිස මුරගාවු දෑ...."

- ප්‍රශ්නය ඉස්මතු කරමින් ඔබේ අදහස් දක්වමින් පිළිතුර අවසන් කරන්න.

(2) "සද්ධර්මාලංකාරය" පොදු ජනයා කුසල ක්‍රියාවන්හි නියැලැවීමේ අරමුණින් රචිත ග්‍රන්ථයකි."

නියමිත කතා වස්තු ඇසුරින් පහදන්න.

- කතුවරයා හා කෘතිය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- ප්‍රශ්නයට අදාළ ව පිළිතුර ආරම්භ කරන්න.

    - "ලංකාවාසී වූ සාධු ජනයාගේ සිත් පහදවමින් ලෝවැඩ වඩා බොහෝ කාලයක් පවත්නා පරිද්දෙන් ධර්ම ව්‍යාඛ්‍යානයක් කළ මැනව යි මෙසේ...."

- කතා වස්තු දෙක (**ස්වර්ණතිලකා හා නන්දිවාණිජ**) පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.

    - "ලෝකස්වාමි වූ අනාථ නාථ වූ භාග්‍යවතුන් ත්‍රෛලෝක්‍ය ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ උදෙසා දන් මා විසින් පුදන ලද්දා වූ මේ මල් පූජාවෙහි අනුසසින් මතු සසර මම උපනුපන් ජාතියෙහි යහපත් රූ ඇති වෙම්ව යි...."

    - "එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට, මලස්න නො සෝධා, කුමක් පිණිස මල් පිදී ද? තී කෙළේ කටයුත්තෙක් නො වේ."

    - "චණ්ඩාල කෙලී නම් තෙපි ම යැ"

    - "මයුර ජාතීහු වනාහි පූර්වජන්මයෙහි කළ එක් අකුශලයකින් තිරිසන් යෝනියෙහි උපදනාහ; අනික් කුශලකර්ම බලයකින් නානාවර්ණ ව ඉතා පැහැපත් වූ වර්ණ සෞන්දර්යයෙන් යුක්ත වෙති"

    - "තද හීයකින් විත් කෑ මුවකු සේ ද,.... ඇගේ රූපශ්‍රීය බලා සුරා පානයෙන් එම විට උමතු ව ගියා සේ මූර්ඡාව භ්‍රාන්ත ව"

    - "මේ කුණු ශරීරයෙන් තොපගේ අමාත්‍යයන්ට ප්‍රයෝජන කිම් ද? එම්බා මේ ශරීරය නම් මුත්තකින් මැණිකකින් රනකින් රත්රනකින් නිමියේ නො වෙයි; "

    - "මෝ තොමෝ තමාගේ ගෙහිමියෝ ඉක්ම පවත්නී ය යි මටත් නින්දා වන්නෝ ය; "

    - "මේ උන්නා වූ තොප ඇමදෙනා අතුරෙන් පරදේශයට ගිය මිනිසුන් මරන්ට කවරෙක් සමර්ථ දෑ.... "

- නන්දියගේ මෛත්‍රියත් යක්ෂයා ශිව හා යකැදුරා මරණයට පත් කිරීමත් ගෙනහැර දක්වන්න.